මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01 Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PF/P/SR/01/10
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2010.08.31

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක :448

සියළුම අමාත්‍යාංශ ලේකම් වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම් වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම් වරුන්

පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරී සහ රජය සතු සමාගම්වල

සභාපති වරුන් වෙත,

**මිල සැඳහුම් ක්‍රමය (Shopping) යටතේ භාණ්ඩ හා සේවා සඳහා**

**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2011**

**( වැඩ හා උපදේශක සේවා හැර )**

උක්ත විෂයය සම්බන්ධයෙන් නිකුත් කළ 2008.09.26 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 433, 2008.12.26 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 433 (i), 2009.09.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 433 (ii) හා 2009.11.20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 440 කෙරෙහි අවධානය යොමු කරන අතර සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ ඉහත සඳහන් සියළුම චක්‍රලේඛ 2011.01.01 දින සිට අවලංගු කරනු ලබන අතර, එතැන් සිට රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 448 වූ මෙම චක්‍රලේඛයේ විධි විධාන පමණක් ක්‍රියාත්මක වේ.

02. ඉහත චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව බස්නාහිර පළාත තුළ පිහිටි රාජ්‍ය ආයතන සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් මිල සැඳහුම් ක්‍රමය (Shopping ) යටතේ භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

2.1 දැනට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ www.treasury.gov.lk හා www.pfd.gov.lk වෙබ් අඩවිවල ප්‍රසිද්ධ කර ඇති 2010 සැපයුම්කරුවන්ගේ ලැයිස්තුව මෙම වර්ෂයේ ඉදිරි කාලය සඳහා භාණ්ඩ හා සේවා ලබා ගැනීම වෙනුවෙන් තවදුරටත් අදාළ කරගත හැකිය.

2.2 මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය, 2011 වර්ෂයේ සිට සංශෝධනය කරනු ලබන අතර රාජ්‍ය ආයතන වලට මිල සැඳැහුම් ක්‍රමය යටතේ භාණ්ඩ හා සේවා සපයා ගැනීම සඳහා පහත සඳහන් විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකිය.

2.2.1 සියලුම රාජ්‍ය ආයතන විසින් මිල සැසඳුම් ක්‍රමය යටතේ ලබාගන්නා භාණ්ඩ හා සේවා සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් වාර්ෂිකව නිකුත් කරන ව්‍යාපාරික නාමාවලියෙහි (Rainbow Pages) සඳහන් නිෂ්පාදකවරුන් / සැපයුම්කරුවන් වෙතින් ඔබ ආයතනයෙහි අවශ්‍යතාවයන්ට හා අරමුණුවලට ගැලපෙන ආකාරයෙන් සැපයුම්කරුවන් තෝරා ගැනීමේ නිර්ණායකයන් හඳුනාගෙන සමස්ථ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි විනිවිද භාවය හා තරගකාරීත්වය තහවුරුවන පරිදි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 ඡේද 3.4 උපදෙස් පරිදි හා ප්‍රසම්පාදන අත්පොතෙහි ඡේද 2.14.1 හි නියම කර ඇති මූල්‍ය සීමාවන් තුළ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

2.2.2. ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන නාමාවලියේ Rainbow Pages - ව්‍යාපාරික නාමලේඛණයෙහි සඳහන් නොවන භාණ්ඩ හා සේවා සපයා ගැනීමට අවශ්‍ය රාජ්‍ය ආයතන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 ඡේද 3.4.3 හි විධිවිධාන අනුව සිය අවශ්‍යතා සපුරා ගතයුතුය.

03. 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රතිපාදන වලින් බැහැරව කටයුතු කිරීම සඳහා විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති හෝ විශේෂ චක්‍රලේඛ උපදෙස් හෝ යම් නීතියක් මගින් ප්‍රතිපාදන සලසා ඇති රාජ්‍ය ආයතන සඳහා මෙම චක්‍රලේඛ උපදෙස් අදාළ නොවනු ඇත.

04. මෙම චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන ලෙස ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අනුබද්ධ සියළුම ආයතන දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

පී.ජී. අබේසේකර
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

පිටපත : විගණකාධිපති